**මන්නාරම ප්‍රාදේශීය සභාව**

**-----------------------------**

**මන්නාරම දිස්ත්‍රික්කය**

**-------------------------**

**1.** **මූල්‍ය ප්‍රකාශන**

----------------

**1.1** **මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

-------------------------------

2019වර්ෂයේ මූල්‍යප්‍රකාශන 2020 පෙබරවාරි 28 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, මූල්‍යප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව හා විස්තරාත්මක කළමනාකරණ වාර්තාව පිළිවෙලින් 2020ජූනි 30දින හා 2020 ජූලි 17 දින සභාපතිවරයාට ඉදිරිපත් කර තිබුණි.

**1.2** **තත්ත්වාගණනය කළ මතය**

--------------------------------

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම් හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට මන්නාරම ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යයසාධනය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලටඅනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.3** **තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

--------------------------------------------

(අ) **ගිණුම්කරණ අඩුපාඩු**

----------------------

| | **විගණන නිරීක්ෂණය** | **ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය තුළ සභාව විසින් ඉදිකරන ලද මාර්ග තුනේ වටිනාකම රු.9,498,901 ක් වුවද, මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන වත්කම්වල වටිනාකම රු.3,337,197 කින් අඩු කර තිබීම හේතුවෙන් එය රු.6,161,704 ක් ලෙස පෙන්නුම් කර තිබුණි. | එළඹෙන මූල්‍ය ප්‍රකාශනවල වෙනස නිවැරදි කරන බව කරුණාවෙන් දන්වමි. | මූල්‍ය ප්‍රගති වාර්තාව සහ අවසාන ගිණුම් ශේෂයන් අනුකූල විය යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂය තුළ පළාත් සංවර්ධන අරමුදලින් සිදු කරන ලද රු.2,739,496 ක් වටිනා ගොඩනැගිලි සංවර්ධන කටයුතු තුනක ප්‍රාග්ධන වියදම් ලෙස ගිණුම්ගතකර නොමැති අතර අයහාර වියදම් ලෙස වැරදියට පෙන්වා තිබුණි.මේ අනුව මූල්‍ය ප්‍රකාශනවල වත්කම් වටිනාකම අඩුවෙන් දක්වා තිබුණි. | ප්‍රත්‍යාගණනයෙන් පසු වර්තමාන අගයට ගොඩනැගිලි ඇතුළත් කරනු ඇත. | ප්‍රාග්ධන අරමුදලින් සිදු කරනු ලබන කාර්යයන් ප්‍රාග්ධන වියදම් ලෙස සැලකිය යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඈ) | වටිනාකම රු.117,550 ක් වූ විදුලි උපකරණ සහ ඉන්ධන ලීටර් 585 ක වටිනාකම මූල්‍ය ප්‍රකාශනවලට ගෙන නොතිබුණි. | ඉදිරි මූල්‍ය වර්ෂයේදී ගැලපීම් සිදු කරනු ලැබේ. | වර්ෂය අවසානයේදී තොගයේ වටිනාකම නිවැරදිව ගණනය කර මූල්‍ය ප්‍රකාශයට ගත යුතුය. |
| (ඇ) | 2019 දී වටිනාකම රු.698,100 ක යන්ත්‍රාගාර හා යන්ත්‍රෝපකරණ සභාව විසින් මිලදීගෙන තිබුණු නමුත් එය මූල්‍ය ප්‍රකාශනවල රු.774,600 ක් ලෙස සටහන් කර තිබුණු අතර වෙනස වූ රු.76,500 ක් පසුගිය වර්ෂවලදී සභාව විසින් මිලදීගත් යන්ත්‍රෝපකරණ විය. අනුමත කිරීමකින් තොරව වර්තමාන මූල්‍ය ප්‍රකාශනවල මෙම වත්කම් සඳහා ජර්නල් සටහන් ඇතුළත් කර තිබුණි. | 2020 වර්ෂය සඳහා වන මූල්‍ය ප්‍රකාශනවල ගැලපීම් කරනු ලැබේ. | සුදුසු ජර්නල් සටහන් ඇතුළත් කර මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතුය. |
| (ඉ) | සභාවේ භාණ්ඩ සමීක්ෂණ වාර්තාවට අනුව කපාහැර ඇති භාණ්ඩවල වටිනාකම රු.735,822 ක් වූ අතර ප්‍රාග්ධන ප්‍රදාන ගිණුමෙන් රු.764,150 ක් අඩු කර තිබුණි.ප්‍රාග්ධන වියදමින් අඩු කර ඇති රු.28,328 ක් ද්විගණනය වී තිබුණු අතර එය ඒකාබද්ධ අරමුදලේ අගය වැඩිවීමට හේතුවී තිබුණි. | 2020 වර්ෂය සඳහා වන මූල්‍ය ප්‍රකාශනවල ගැලපීම් කරනු ලැබේ. | ගිණුම්කරන දෝෂ මඟහරවා ගත යුතුය. |

**1.4 අනුකූල නොවීම**

**1.4.1 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

| | නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම් | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 2018 අංක 19 දරණ ජාතික විගණන පනත 16(2) උප වගන්තිය | සමාලෝචිත වාර්ෂික සඳහා කාර්ය සාධන වාර්තාවක් ඉදිරිපත් කර නොතිබුණි. | කාර්ය සාධන වාර්තාවක් ඉදිරියේදී ඉදිරිපත් කරනු ලැබේ. | නියමිත කාල සීමාව තුළ විගණනය සඳහා වාර්තා ඉදිරිපත් කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| **(ආ)** | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි<br>මුදල් රෙගුලාසි 571 | වසර දෙකකට වඩා වැඩි රු.257,692 ක් වූ ඇප තැන්පතු හතක් සම්බන්ධයෙන් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | තැන්පතු හත ආපසු ගෙවීමට කටයුතු කරනු ලැබේ. | මුදල් රෙගුලාසි ප්‍රකාරව සුදුසු පියවර ගත යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

---------------------

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

--------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.7,724,717 ක් වූ අතර ඊට අනුරූපී ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.9,153,708 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

-----------------------

### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම, බිල්කළ ආදායම, රැස්කළ ආදායම හා හිඟ ආදායම

-----------------------------------------------------------------------------------------

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබුණු ඇස්තමේන්තුගත ආදායම, බිල්කළ ආදායම, රැස්කළ ආදායම හා හිඟ ආදායම් පිළිබඳ විස්තර පහත දැක්වේ.

| ආදායම් ප්‍රභවය | 2019 | | | | 2018 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු. | රු. | රු | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 3,350,111 | 304,205 | 434,640 | 738,824 | 526,000 | 239,355 | 163,082 | 808,659 |
| කුලී | 10,610,900 | - | 9,603,416 | 2,809,977 | 9,595,600 | - | 7,952,916 | 2,830,000 |
| බලපත්‍ර ගාස්තු | 2,392,750 | - | 1,739,630 | - | 719,250 | - | 1,445,725 | - |
| සේවා ගාස්තු | 669,800 | - | 1,595,232 | 33,000 | 571,900 | - | 593,379 | - |
| වෙනත් ආදායම් | 8,774,126 | - | 14,604,643 | 8,244,862 | 8,657,130 | - | 19,272,883 | 14,337,065 |
| | **25,797,687** | **304,205** | **27,977,561** | **17,975,723** | **20,068,980** | **239,355** | **28,834,606** | **17,975,724** |

**2.2.2 ආදායම්ඒකතුකිරීමේකාර්යසාධනය**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂය සඳහා තක්සේරු කරන ලද වරිපනම් සහ බදු රු.3,350,111 ක් වූ අතර එකතු කළ ආදායම රු.434,640 ක් වූයෙන් එය දළ තක්සේරුවෙන් සියයට 8 ක් විය.ආදායම් එකතු කිරීමේ අකාර්යක්ෂමතාව මෙයින් අනාවරණය වනු ඇත. | 2020 දී අයවැය නිසි ලෙස සකස් කෙරෙන අතර ආදායම් එකතු කිරීමට පියවර ගනු ලැබේ. | ලැබිය යුතු ආදායම සඳහා අයවැය සකස් කළ යුතු අතර ආදායම් එකතු කිරීමට පියවර ගත යුතුය. |

**2.2.3 වරිපනම්හාබදු**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| මන්නාරම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුල ඉඩම් සහ ඉදිකරන ලද නිවාස හා ගොඩනැගිලි සඳහා 2017 සහ 2018 වර්ෂය සඳහා දේපල බදු හිඟ මුදල් ලෙස රු.723,242 ක් එකතු කර නොතිබුණි. | මෙම වර්ෂයේදී අපි විසින් කාර්යාල නිලධාරීන්ගේ සහාය ඇතිව වරිපනම් හා බදු එකතු කිරීමට අදහස් කරමු.නැවත තක්සේරු කිරීම සඳහා ලිපි ලේඛන භාරදී ඇත. | නියමිත වේලාවට හිඟ ආදායම් එකතු කිරීමට පියවර ගත යුතුය. |

**2.2.4 කුලී**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සභාව සතු හරක් මස් වෙළඳසැල්, වාහන නැවැත්වීමේ බදු සහ දෛනික වෙළඳපොළෙන් දිගුකාලයක සිට අයවීමට තිබුණු රු.928,496 ක ආදායමක් අය කර ගැනීමට කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | අය නොවුණු අයකිරීම් පිළිබඳ චෝදනා අධිකරණයට ඉදිරිපත් කිරීමට ජුනි මස සභා රැස්වීමේදී අවසර ලබාදී ඇත. ඉදිරි කාලවලදී අධිකරණ ක්‍රියාමාර්ග මගින් එකතු කිරීමට අපි අදහස් කරමු. | නියමිත කාල සීමාව තුළ හිඟ මුදල් අයකර ගැනීමට පියවර ගත යුතුය. |

**2.2.5 උසාවිදඩමුදල්සහමුද්දරගාස්තු**

**(අ) උසාවිදඩමුදල්**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2019 දෙසැම්බර් 31 දිනට රු.4,011,035 ක උසාවි දඩ මුදල් ලැබිය යුතුව තිබුණි. | 2020 දී ගත් තීරණයට අනුව එකතු කිරීම ඉල්ලීම් අනුව සිදු කෙරෙන අතර, ඉල්ලීම ඉදිරිපත් කර එම ඉල්ලීම මගින් ලබාගෙන ඇත. | නියමිත කාල සීමාව තුළ උසාවි දඩ අයකර ගැනීම සඳහා සුදුසු පියවර ගත යුතුය. |

(ආ) මුද්දරගාස්තු

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2019 දෙසැම්බර් 31 දිනට රු.3,852,177 ක මුද්දර ගාස්තු ලැබිය යුතුව තිබුණි. | 2020 දී ගත් තීරණයට අනුව එකතු කිරීම ඉල්ලීම් අනුව සිදු කෙරෙන අතර ඉල්ලීම් ඉදිරිපත් කිරීමට පියවර ගනු ලැබේ. | නියමිත කාල සීමාව තුළ මුද්දර ගාස්තු අය කර ගැනීමට පියවර ගත යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්යසාධනය

සුභසාධනය, පහසුකම්, මහජනතාවගේ සෞඛ්‍ය සම්පන්න පරිසරය, පොදු පහසුකම් සහ පොදු මහාමාර්ග, මහජන සෞඛ්‍ය සම්බන්ධ කරුණු විධිමත් කිරීම සහ පාලනය කිරීම වැනි ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය ප්‍රකාරව සභාව විසින් ඉටු කළ යුතු යුතුකම් සම්බන්ධයෙන් පහත කරුණු අනාවරණය විය.

**(ආ) තිරසරසංවර්ධනඅරමුණු**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2018 අප්‍රේල් 23 දිනැති අංක. General No.2018/61 දරන විගණකාධිපති ලේකම් කාර්යාල චක්‍රලේඛය ප්‍රකාරව සාගර හා සාගර සම්පත් ආරක්ෂා කරන අතරම තිරසාර සංවර්ධනය සඳහා තිරසාර දැනුවත්භාවය සහ සමුද්‍රීය හා සමුද්‍ර දූෂණය පාලනය කිරීමේ සැලසුම් සකස් කර නොතිබුණි. | අනාගතයේදී දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට සහ මහජනතාවට උපදෙස් දීම සඳහා පියවර ගනු ලැබේ. | අදාළ සැලැස්ම් සකස් කර ක්‍රියාත්මක කිරීමට පියවර ගත යුතුය. |

**3.2 කළමනාකරණඅකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| **(අ)** | සභාවේ අනුමැතියකින් තොරව අතීතයේ දී නිම කරන ලද නිවාස ව්‍යාපෘති 716 ක් සඳහා අනුකූලතා සහතික වෙනුවෙන් රු.1, 116,960 ක මුදලක් ලැබී නොතිබුණි. මෙමඟින් ආදායම් අහිමිවී තිබුණි. | ප්‍රතිලාභීන්ගේ තොරතුරු එක්රැස් කිරීමෙන් පසු පුද්ගලිකව ලිපි යැවීමට පියවර ගනු ලැබේ. | වරින් වර අදාල අනුමැතිය ලබා ගැනීමට සභාව විසින් පියවර ගත යුතුය. |
| **(ආ)** | සමාලෝචිත වර්ෂය තුළ මහජනයාගෙන් ලැබී තිබුණු පැමිණිලි 6 ක් සම්බන්ධයෙන් මාස 11 කට වැඩි කාලයක් සභාව විසින් කිසිදු ඵලදායී පියවරක් ගෙන නොතිබුණි. | මේ වන විට මේ සම්බන්ධයෙන් අවසන් කටයුතු කිරීමට පියවරගනිමින් සිටී. | සියලුම පැමිණිලි නියමිත කාල සීමාව තුළ විසඳිය යුතුය. |
| **(ඇ)** | සභාව සතු වාහන කුලියට දීමෙන් අයවියයුතු රු.593,724 ක හිඟ මුදල් රැස් කිරීමට කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | හිඟ ආදායම එකතු කිරීමට පියවර ගනිමින් සිටී. | දිගුකාලීන කුලී ආදායම් අය කර ගැනීමට පියවර ගත යුතුය. |

**3.3 මානවසම්පත්කළමනාකරණය**

**(අ) පුරප්පාඩුසහඅතිරික්ත**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සභාවේ සේවක පුරප්පාඩු 14 ක් පුරවා නොතිබුණු අතර එම පුද්ගලයින් විසින් සිදු කළ කාර්යයන් කෙරෙහි එමගින් බලපෑම් ඇති වී තිබුණි. | පුරප්පාඩු සඳහා කඩිනමින් සේවකයින් බඳවා ගැනීමට මේ වන විට පියවර ගනිමින් සිටී. | නියමිත කාල සීමාව තුළ පුරප්පාඩු පිරවිය යුතු අතර වඩා හොඳ සේවාවක් සහතික කිරීම සඳහා සභාව විසින් පියවර ගත යුතුය. |

(ආ) **සේවකඇපතැන්පතු**

| විගණන නිරීක්ෂණය | | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | 2017 මාර්තු 04 දිනැති අංක. PF/01/2017 දරන පළාත් මුදල් චක්‍රලේඛයේ 06 ඡේදය ප්‍රකාරව, ඇප තැන්පතු ගෙවා වෙනත් අමාත්‍යාංශයකට හෝ දෙපාර්තමේන්තුවකට මාරු වන නිලධාරියා සම්බන්ධ සම්පූර්ණ තොරතුරු හා ලිපි ලේඛන අදාළ අමාත්‍යාංශයට හෝ දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කළ යුතුය. කෙසේ වෙතත්, ප්‍රාදේශීය සභාවෙන් විවිධ හේතූන් මත ඉවත්වූ නිලධාරීන් 05 කට අදාල රු.14,000 ඇප සම්බන්ධ තොරතුරු යවා නොතිබුණි. | අදාළ නිලධාරීන්ගේ ඇප තැන්පතු පිළිබඳ ලිපි ලේඛන ළඟදීම අදාළ දෙපාර්තමේන්තු වෙත යවනු ලැබේ. | ඇප තැන්පතු ගෙවූ නිලධාරියාගේ තොරතුරු නියමිත කාල සීමාව තුළ අදාළ අමාත්‍යාංශයට හෝ දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කළ යුතුය. |
| (ii) | 2017 මාර්තු 04 දිනැති අංක. PF/01/2017 දරන පළාත් මුදල් චක්‍රලේඛය ප්‍රකාරව, නිලධාරීන් විසින් ගෙවිය යුතු අවම සේවක ඇප තැන්පතු වටිනාකම රු.147,500ක් වන නමුත් රු.72,500 ක් පමණක් ගෙවා තිබුණි. | ඉතිරි මුදල වැටුපෙන් අයකර ගැනීමට පියවර ගනු ලැබේ. | අදාළ නිලධාරීන්ගෙන් හිඟ මුදල අයකර ගැනීමට පියවර ගත යුතුය. |

3.4 **මෙහෙයුම්අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා ආඥා පනතේ 52 වගන්තියට පටහැනිව, පසුගිය වසර 5 තුළ ගොඩනැගිලි 105 ක් සඳහා අවසර ලබාගැනීම ප්‍රතික්ෂේප කර ඇති නමුත් ඉන් 70 ක්ම නිම කර තිබුණි.කෙසේ වෙතත්, මේ සම්බන්ධයෙන් සභාව විසින් වැඩිදුර ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | අවසරය ලබා නොගෙන ගොඩනැගිල්ල සම්පූර්ණ කර ගොඩනැගිලි හිමියන්ට පසුව අවසර ලබා ගැනීමට ලිඛිතව දැනුම් දීමක් කිරීම මගින් අනවසර ගොඩනැගිලි සඳහා අනුකූලතා සහතික නිකුත් කිරීමට සභාව හරහා පියවර ගනු ලැබේ . | ප්‍රාදේශීය සභා ආඥා පනතේ 52 වගන්තිය යටතේ සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුය. |

## 3.5 වත්කම්කළමනාකරණය

### 3.5.1 ලියාපදිංචිනොකළවත්කම්

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| මෙම සභාව සතු ඉඩම් කැබලි පහළොවක් වසර දහයකට වැඩි කාලයක් තිස්සේ තක්සේරු කර මූල්‍ය ප්‍රකාශනයට ගෙන නොමැති අතර ශේෂ පත්‍රයේ දේපලවල වටිනාකම අඩුවී තිබුණි. | ලියකියවිලි තීරණය කර ලබා ගත් පසු, දෙපාර්තමේන්තුව විසින් මිල තක්සේරු කර ඇගයීමට ලක් කර ගිණුම්වලට එකතු කරනු ලැබේ. | ඉඩම් තක්සේරු කර වත්කම් ලේඛනයේ ලියාපදිංචි කළ යුතුය. |

### 3.5.2 නඩත්තුහාඅළුත්වැඩියාකිරීමටඅසමත්වීම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2019 දී සභාවෙන් සොයාගත් වටිනාකම රු.10,119,000 ක් වූ වාහන 13 ක් වසර 01 සිට 05 දක්වා කාලයක් අලුත්වැඩියා කර භාවිතා කිරීමට කිසිදු පියවරක් ගෙන නොතිබුණි. | භාවිතයට ගත හැකි වාහන අළුත්වැඩියා කර භාවිතා කිරීමටත්, වෙනස් කිරීම් කර භාවිතා කිරීමට සුදුසු යැයි පෙනෙන වාහන සඳහා සුදුසු විකල්ප ක්‍රියාමාර්ග ගැනීමටත් තීරණය කර ඇත. | නියමිත කාල සීමාව තුළ වාහන අලුත්වැඩියා කර භාවිතා කිරීමට පියවර ගත යුතුය. |

### 3.5.3 වත්කම්වලින්ලැබියයුතුආදායමලබාගැනීමටඅපොහොසත්වීම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| අළුත්වැඩියා කටයුතු හේතුවෙන් මෙම සභාවට අයත් ZA 3165 දරන වාහනය වසරකට වැඩි කාලයක් භාවිතයට ගත නොහැකි වීම හේතුවෙන් සාමාන්‍යයෙන් රු.1,500,000 ක අලාභයක් සිදුවී තිබුණි. | යන්ත්‍රය මේවන විට සම්පූර්ණයෙන්ම වෙනස් කර භාවිතයට ගෙන ඇත. | නියමිත කාල සීමාව තුළ වාහන අලුත්වැඩියා කර භාවිතයට ගත යුතු අතර ආදායම් එකතු කිරීමට පියවර ගත යුතුය. |

### 3.5.4 අත්පත්කරනොගත්වත්කම්

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සභාව විසින් පරිහරණය කරනු ලබනවටිනාකම රු.4,090,000 ක් වූ වහන 10 ක අයිතිය පවරාගෙන නොතිබුණු අතර මේ සම්බන්ධයෙන් වැඩිදුර ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | මේවන විට, අඛණ්ඩව හිමිකාරිත්වය පැවරීම සඳහා ක්‍රියාමාර්ග ගනිමින් පවතී. | නියමිත කාල සීමාව තුළ අයිතිය මාරු නොකළ වාහනවල අයිතිය මාරු කිරීමට පියවර ගත යුතුය. |

### 3.6 ප්‍රසම්පාදනය

### 3.6.1 ප්‍රසම්පාදනසැලැස්ම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2006 වර්ෂයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2 වගන්තිය ප්‍රකාරව වර්ෂය සඳහා වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්මක් සභාව විසින් සකස් කර නොතිබුණි. | එළඹෙන වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කිරීමට පියවර ගනු ලැබේ. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය ප්‍රකාරව වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කළ යුතුය. |

## 4. ගිණුම්කටයුතුභාවයහායහපාලනය

### 4.1 අයවැයපාලනය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| වර්ෂය සඳහා වන අයවැය අනුව ගමන් වියදම් සහ සංයුක්ත දීමනා සම්බන්ධයෙන් සත්‍ය පිරිවැය අතර වෙනස සියයට 07 ත් සියයට 56 ත් අතර පරාසයක් වූ අතර එමගින් අයවැයෙහි අකාර්යක්ෂමතාව ඉස්මතු කෙරිණි. | අනාගතයේ දී එවැනි අඩුපාඩු නොමැතිව අයවැය කාර්යක්ෂමව සකස් කරනු ඇත. | පිරිවැය පාලනය සහතික කිරීම සඳහා පියවර ගත යුතුය. |

## 4.2 අභ්‍යන්තරවිගණනය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සභාවේ කටයුතු ඵලදායීව හා කාර්යක්ෂමව සමාලෝචනය කිරීම සඳහා අභ්‍යන්තර විගණන ඒකකයක් පිහිටුවා ඇති අතර, වර්ෂික සමාලෝචනය සඳහා සිදු කරන ලද අභ්‍යන්තර විගණන පරීක්ෂණ කිසිදු ප්‍රගතියක් ලබා නොතිබුණි. | අභ්‍යන්තර විගණන නිලධාරියා අභ්‍යන්තර විගණනය සඳහා පමණක් වෙන්කර ඇති බව සහතික කිරීමට පියවර ගෙන තිබේ. | අභ්‍යන්තර විගණනයේ ඵලදායීතාවය සහතික කිරීමට පියවර ගත යුතුය. |